[අටවැනි පාර්ලිමේන්තුව (පළමුවැනි සභාවාරය) - පළමුවැනි රැස්වීම]

අංක. 1.]

# පාර්ලිමේන්තුවේ වැඩ පිළිවෙළ

**2015 සැප්තැම්බර් මස 01 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

**1. රැස්වීම කැඳවීම පිළිබඳ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශන පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කියවීම:**

**2. කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත් කිරීම:**

(අංක 4 දරන ස්ථාවර නියෝගය)

"4. කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමේ ක්‍රියා පිළිවෙළ පහත සඳහන් සේ විය යුතු ය :—

(1) කථානායක වශයෙන් ඡන්දයෙන් තෝරා පත් කිරීමට මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කරනු රිසි සෑම මන්ත්‍රීවරයකු ම, පළමු කී මන්ත්‍රීවරයා ඡන්දයෙන් තෝරා පත් කරනු ලැබුවහොත් සේවය කිරීමට ඔහු කැමති බව ඊට කලින් ඔහුගෙන් විමසා දැනගත යුතු ය.

(2) එක් මන්ත්‍රීවරයකු විසින්, මහ ලේකම් අමතමින්, එම අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ සිටින අනික් මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවේ කථානායක පදවියට පත් කළ යුතු යයි, "........................ (මන්ත්‍රීවරයා නමින් සඳහන් කරමින්) කථානායක වශයෙන් මෙම පාර්ලිමේන්තුවේ මූලාසනාරූඪ විය යුතුය"යි යෝජනාවක් ඉදිරිපත් කළ යුතු ය. එම යෝජනාව ස්ථිර කරනු ලැබිය යුතු ය; එහෙත් ඒ පිළිබඳ විවාදයකට ඉඩ නොදිය යුතු ය.

(3) මේ අන්දමට කථානායක වශයෙන් යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලබනුයේ එක් මන්ත්‍රීවරයකු පමණක් නම්, ඔහු ඡන්දයෙන් තෝරා පත් කරනු ලැබූ බව මහ ලේකම් විසින් ප්‍රශ්නය නොවිමසා ප්‍රකාශ කළ යුතු ය. එක් මන්ත්‍රීවරයකුට වැඩි දෙනෙක් මේ අන්දමට යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලබත් නම්, බෙදුම් සීනු විනාඩි දෙකක් නාද කිරීමෙන් පසුව ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් කථානායකවරයකු තෝරා පත් කිරීම පාර්ලිමේන්තුව විසින් කළ යුත්තේ ය.

(4) ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීමක් පැවැත්වීමේ දී, පාර්ලිමේන්තුවට පැමිණ සිටින එක් එක් මන්ත්‍රීවරයාට, තමා ඡන්දය දීමට කැමති මන්ත්‍රීවරයාගේ නම ලිවීම පිණිස, ඡන්ද පත්‍රිකා එක බැගින් මහ ලේකම් විසින් දිය යුතු ය. ඡන්ද පත්‍රිකාවල ලියා තිබෙන නම් නොපෙනෙන සේ ඡන්ද පත්‍රිකා නැමිය යුතුවාක් මෙන්ම ඡන්දය දෙන මන්ත්‍රීවරයා විසින් අත්සන් කළ යුතු ද වේ.

(5) මහ ලේකම් හෝ ඔහු විසින් ඒ සඳහා යොදවන ලද පාර්ලිමේන්තුවේ යම් කිසි නිලධාරියකු විසින් ඡන්ද පත්‍රිකා එකතු කළ යුතු ය. තවද, පාර්ලිමේන්තුවේ මේසය මත දී මහ ලේකම් විසින් ඒවා ගණන් කිරීම කළ යුතු ය; ඡන්ද විමසීමේ ප්‍රතිඵලය මහ ලේකම් විසින් ප්‍රකාශ කළ යුතු ය.

(6)(අ) අපේක්ෂකයන් දෙදෙනකුට වැඩි ගණනකගේ නම් යෝජනා කර ඇති අවස්ථාවක දී ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන ලද පළමුවන ඡන්ද විමසීමෙන් එක් අපේක්ෂකයකුටවත් අනික් අපේක්ෂකයන් සියල්ලන්ට ම ලැබී තිබෙන මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද ගණනක් ලැබී නොමැති නම්, ඡන්ද අඩුම ගණන ලබා ගත් අපේක්ෂකයා ඡන්ද විමසීමෙන් බැහැර කොට ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම ඉදිරියට ගෙන යා යුතු ය. ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන සෑම ඡන්ද විමසීම් වාරයකදී ම ඡන්ද අඩුම ගණන ලබා ගන්නා අපේක්ෂකයා බැහැර කරමින්, එක් අපේක්ෂකයකු, ඉතිරි වී සිටින අනික් අපේක්ෂකයා ලබා ඇති ඡන්ද ගණනට හෝ ඉතිරි වී සිටින අනික් අපේක්ෂකයන් ලබා ඇති මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා තෙක්, අවස්ථානුකූලව, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම කළ යුතු ය.

(ආ) අපේක්ෂකයන් තිදෙනකු හෝ ඊට වැඩි දෙනෙකු අතර ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන ඡන්ද විමසීමකින් අපේක්ෂකයන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනෙකු එක සමාන ඡන්ද ගණනක් ලැබ සිටින අවස්ථාවක දී, මෙහි (අ) ඡේදය යටතේ ඉන් එක් අපේක්ෂකයකු ඡන්ද විමසීමෙන් බැහැර කළ යුතු වන විට, එක සමාන ඡන්ද ගණනක් ලත් අපේක්ෂකයන් අතරින් බැහැර කළ යුතු අපේක්ෂකයා තෝරා ගැනීම මහ ලේකම් තීරණය කරන අන්දමට කුසපත් ඇදීමෙන් විසඳිය යුතු ය.

(ඇ) අපේක්ෂකයන් දෙදෙනකු අතර ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන ඡන්ද විමසීමක දී ඡන්ද සමසේ බෙදී යතොත්, නැවත වරක් ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්දය විමසිය යුතු ය. එසේ නැවත වරක් ඡන්දය විමසීමේදී ද ඡන්ද සමසේ බෙදී යතොත් ඡන්ද විමසීමෙන් බැහැර කළ යුතු අපේක්ෂකයා තෝරා ගැනීම මහ ලේකම් තීරණය කරන අන්දමට කුසපත් ඇදීමෙන් විසඳිය යුතු ය.

(7) ඡන්ද පත්‍රිකා ගණන් කරන ගමන් ම ඒවා පෙට්ටියක තැන්පත් කර තැබිය යුතු ය. තව ද මන්ත්‍රීවරයකු කථානායක පදවියට ඡන්දයෙන් තෝරා පත්කර ගත් බව ප්‍රකාශ කිරීමෙන් පසු පාර්ලිමේන්තුව ඉදිරිපිට දී පෙට්ටියට මුද්‍රා තබා එක් ලිත් මාසයක් ගතවන තෙක් එය මහ ලේකම්ගේ භාරයෙහි තැබිය යුතු ය. ඊට පසු මහ ලේකම් විසින් පාර්ලිමේන්තුවෙන් ලබන යම් කිසි නියමයක් ඇතොත් ඊට යටත්ව, ඔහු විසින් ඡන්ද පත්‍රිකා පුළුස්සා දමා එසේ කළ බව පාර්ලිමේන්තුවට සහතික කර දැනුම් දිය යුතු ය.''.

**3. නිල ප්‍රතිඥාව හෝ දිවුරුම:**

(අංක 5 දරන ස්ථාවර නියෝගය)

"5. (1) පළමුව තමා නිල ප්‍රතිඥාව හෝ දිවුරුම දී ඊට පසු පාර්ලිමේන්තුවට පැමිණ සිටින මන්ත්‍රීන් සියල්ලන් ම ලවා ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම සහ අත්සන් තැබීම කරවීමට කථානායකවරයා සැලැස්විය යුතු ය. ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම කරවිය යුත්තේ මහ ලේකම් විසිනි.

(2) කථානායකවරයාගෙන් පටන්ගෙන සෑම මන්ත්‍රීවරයකු ම තමා ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම අවසාන කළ වහාම පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් ඒ සඳහා තබා ඇති පොතෙහි අත්සන් කළ යුතු ය.

(3) කලින් ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම කර නොමැති මන්ත්‍රීවරයකුට පාර්ලිමේන්තුව රැස්වන කවර දිනක හෝ 19 වන ස්ථාවර නියෝගය යටතේ නියමිත වේලාවට පාර්ලිමේන්තු මේසය වෙත පැමිණිය හැකි ය; එවිට ඔහු ලවා ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම කරවිය යුතු ය; ඊට පසු ඔහු පොත අත්සන් කළ යුතු ය.''.

**4. නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ඡන්දයෙන් තෝරා පත් කිරීම:**

(අංක 6(2) දරන ස්ථාවර නියෝගය)

"6. (2) නියෝජ්‍ය කථානායකවරයකු සහ කාරක සභාපතිවරයකු ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමේ ක්‍රියා පිළිවෙළ, ඒ ඡන්ද විමසීම් කථානායකතුමා විසින් පැවැත්විය යුතු බව හැරෙන්නට, කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත් කිරීමේ දී අනුගමනය කරන පිළිවෙළට හැකි තරම් සමාන විය යුතු ය.''.

**5. නියෝජ්‍ය කාරක සභාපති ඡන්දයෙන් තෝරා පත් කිරීම:**

(අංක 6(2) දරන ස්ථාවර නියෝගය)

**6. ජනාධිපතිතුමාගෙන් ලත් සංදේශය:**

***අතිගරු ජනාධිපතිතුමා සහා ගර්භයට සම්ප්‍රාප්තවීමෙන් පසුව පාර්ලිමේන්තුව යළි රැස්වූ විට සභාවේ වැඩ පිළිවෙළ මෙසේය:—***

**7. අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව ඇමතීම:**

**8. යෝජනා පිළිබඳ දැනුම්දීම:**

1.

අග්‍රාමාත්‍යතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2015 සැප්තැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු අතර එදින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

අග්‍රාමාත්‍යතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2015 සැප්තැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

**9. පාර්ලිමේන්තුව කල් තැබීම:**